# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 03.වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. වෙළෙඳපොලේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පැවතිය හැකි විවිධ මිල ගණන් යටතේ ඉල්ලුම් ප්‍රමාණයන් දැක්වෙන ලේඛනයකි. මෙම භාණ්ඩයට අදාළ සැපයුම් සමීකරණය වන්නේ, Qs = -100+4P වේ. වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද?

| P | Qd |
|---|---|
| 0 | 80 |
| 5 | 70 |
| 10 | 60 |
| 15 | 50 |

(1) මිල රු.20 ඒකක 30 (2) මිල රු.15 ඒකක 10 (3) මිල රු.60 ඒකක 40
(4) මිල රු.3.30 ඒකක 73 (5) මිල රු.30 ඒකක 20

2. එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් පවතින සැපයුම් සමීකරණය Qs = -100 + 2p නම් මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු. 10/- ක බද්දක් පැනවූවේ යැයි සිතන්න. බද්දට පසු නව සැපයුම් සමීකරණය

(1) $Qs_1 = -100 + 2p$ (2) $Qs_1 = 120 - 2p$ (3) $Qs_1 = -120 + 2p$
(4) $Qs_1 = 100 - 2p$ (5) $Qs_1 = 100 + 2p$


3. වෙළෙඳපොලේ පවතින යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පවතින ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.

Qd = 600 – 10p
Qs = 10p

රජය විසින් මෙම භාණ්ඩය සඳහා රු. 10/- ක බද්දක් පැනවූයේ නම් බද්දට පසු නිෂ්පාදකයාට ලැබෙන මිල කීයද ?

(1) රු.25/- (2) රු.30/- (3) රු.20/- (4) රු.50/- (5) රු.35/-

4.




මෙම ප්‍රස්තාරයට අනුව වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර D හා S මඟින් දැක්වෙන අතර බද්දක් පැනවීමෙන් පසු සැපයුම් වක්‍රය $S_1$ මඟින් දැක්වේ. මේ අනුව මෙම භාණ්ඩය සඳහා,

| | සමතුලිත මිල | බද්දේ ප්‍රමාණය | බද්දෙන් පසු පාරිභෝගිකයාගේ මිල | බද්දෙන් පසු නිෂ්පාදන මිල |
|---|---|---|---|---|
| (1) | 20 | 10 | 5 | 10 |
| (2) | 10 | 5 | 5 | 20 |
| (3) | 15 | 10 | 20 | 10 |
| (4) | 10 | 15 | 10 | 20 |
| (5) | 15 | 1O | 10 | 20 |

5. යම් භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.

$Qd = 80 - 2p$

$Qs = 2p$

සමතුලිතයේදී පාරිභෝගික අතිරික්තය කීයද?

(1) රු.400/- (2) රු.800/- (3) රු.600/- (4) රු.500/- (5) රු.700/-

6. පූර්ණ අනම්‍ය ඉල්ලුම් අවස්ථාවකදී මුළු බදු බර දැරීමට සිදුවන්නේ,
(1) නිෂ්පාදකයාටය.
(2) පාරිභෝගිකයාටය.
(3) පාරිභෝගිකයා හා නිෂ්පාදකයා සම සමව බදු බර දරයි.
(4) පාරිභෝගිකයාට වැඩි බදු බරක් ද නිෂ්පාදකයා අඩු බදු බරක්ද දරයි.
(5) පාරිභෝගිකයාට අඩු බදු බරක් ද නිෂ්පාදකයා වැඩි බදු බරක්ද දරයි.

7. අනම්‍ය ඉල්ලුම් අවස්ථාවකදී රජය විසින් බද්දක් පැනවීමෙන් බදු බර බෙදී යන්නේ,
(1)පාරිභෝගිකයාට පමණි.
(2)රජයට පමණි.
(3)පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට බදු බර සම සමව බෙදී යයි.
(4)නිෂ්පාදකයාට පමණි.
(5)වැඩි බදු බරක් පාරිභෝගිකයාටත් අඩු බදු බරක් නිෂ්පාදකයාටත් බෙදී යයි.

8.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 0 | 100 | 0 |
| 5 | 80 | 100 |
| 10 | 60 | 200 |
| 15 | 40 | 300 |
| 20 | 20 | 400 |
| 25 | 0 | 500 |

ඉහත වෙළෙඳපොළ තොරතුරු අනුව රජය විසින් භාණ්ඩය මත රු2 ක සහනාධාරයක් නිෂ්පාදකයාට ලබා දුනහොත් නව සැපයුම් සමීකරණය වන්නේ,

(1) Qs = 100 + 20p (2) Qs = 40+20p (3) Qs = -100 + 20p

(4) Qs = -100 + 20p (5) Qs = 20p


9. Qd = 80 – 2p, Qs =2p නම් නිෂ්පාදකයා මත රු. 5 ක සහනාධාරයක් ලබා දුන් පසු නිෂ්පාදක අතිරික්තය කීයද?

(1) රු.506.25 (2) රු.1010.50 (3) රු.1012.50 (4) රු.906.25 (5) රු.500.50

10. උපරිම මිල පැනවූ පසු වෙළෙඳපොළ තුළ බිහිවන තත්ත්වයන් වන්නේ,

(1) කළුකඩ මිල, අධි ඉල්ලුම
(2) පෝලිම් ක්‍රමය, අධි සැපයුම
(3) කළුකඩ මිල, අධි සැපයුම
(4) වෙනත් භාණ්ඩයක් සමඟ සම්බන්ධ කොට සලාක කිරීම හා අධි සැපයුම
(5) සලාකපත් යොදා ගැනීමය, ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය


11.




අවම මිල සීමාව පැනවීමෙන් පසු ආර්ථික අතිරික්තය වන්නේ,

(1) A+B+C+D+E (2) A+B+D (3) B+C+D+E
(4) F+G+H (5) C+E


12.




උපරිම මිල සීමාව පැනවීමෙන් පසු වෙළෙඳපොලේ පැවතිය හැකි අධි ඉල්ලුම් තත්ත්වය කීයද?

(1) 0 (2) 500 (3) 1000 (4) 1500 (5) 2000

13. k




ඉහත ප්‍රස්තාරයෙන් දැක්වෙන්නේ සහල් සඳහා පවතින ඉල්ලුම හා සැපයුමයි. රජය විසින් සහල් සඳහා බද්දක් පැනවූයේ නම් බද්ද නිසා රජය ලැබූ බදු ආදායම වන්නේ,

(1) B C G F වේ. (2) C F D E වේ. (3) G F වේ.
(4) A B C G F H වේ. (5) H I වේ.

14. Qd = 200 – 4p, Qs = - 120+6p මිල රු.30 දී අධි ඉල්ලුම් ප්‍රමාණය ගණනය කරන්න.

(1) ඒකක 20 (2) ඒකක 40 (3) ඒකක 80
(4) ඒකක 100 (5) ඒකක 60

15. වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.

Qd = 80 - 2p

Qs = 2p නම් රජය විසින් රු.5 ක සහනාධාරයක් ලබා දුන්නේ නම් සහනාධාරයට පසු සැපයුම් සමීකරණය,

(1) $Qs_1 = 2 + 10p$ (2) $Qs_1 = 10p$ (3) $Qs_1 = 10 - 2p$

(4) $Qs_1 = 2p$ (5) $Qs_1 = 10 + 2p$

16. කෘෂිකාර්මික භාණ්ඩ මිල ස්ථායිකරණය සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,
    (1) අවම මිල ප්‍රතිපත්තිය
    (2) සහතික මිල ක්‍රමය
    (3) ඌන පූරණ ගෙවීම් ක්‍රමය
    (4) උපරිම මිල ප්‍රතිපත්තිය
    (5) අපනයනය සඳහා සහනාධාර ලබාදීම.

17. අවම මිල ප්‍රතිපත්තිය නිසා වෙළෙඳපොළ තුළ ඇති විය හැකි ප්‍රතිවිපාකයන් වන්නේ,
    (1) අධි ආයෝජන තත්ත්වයක් හට ගැනීම.
    (2) පෝලිම් ක්‍රමයක් බිහිවීම.
    (3) අල්ලස් මඟින් සලාක කිරීම.
    (4) කළු කඩ මිලක් බිහිවීම.
    (5) සලාක පත් යොදා ගැනීම.

18. ප්‍රශ්න අංක 18 හා 19 සඳහා මෙම ඉල්ලුම් සැපයුම් සමීකරණ භාවිතයෙන් පිළිතුරු සපයන්න.

$Qd = 200 - 4p$

$Qs = - 40 + 6p$ රජය විසින් රු. 5/- සහනාධාරයක් සැපයුවේ නම් සහනාධාරයට පසු සැපයුම්කරුවන් ලබන මිල වන්නේ,

(1) රු.21/- (2) රු.26/- (3) රු.27/- (4) රු.30/- (5) රු.28/-

19. රු. 5/- ක් වූ සහනාධාරය නිසා වැඩි වාසිය හිමිව ඇත්තේ,
    (1) නිෂ්පාදකයාටය.
    (2) පාරිභෝගිකයාටය.
    (3) රජයටය.
    (4) පාරිභෝගිකයාට වැඩි වාසියකුත් නිෂ්පාදකයාට අඩු වාසියකුත් හිමි වේ.
    (5) නිෂ්පාදකයාට වැඩි වාසියක් හා පාරිභෝගිකයාට අඩු වාසියකි.

20. තරඟකාරී වෙළෙඳපොලේ අලෙවි වන භාණ්ඩයක ඉල්ලුම් නම්‍යතාව -0.2 ක්ද සැපයුම් නම්‍යතාව 0.3ක්ද වේ. මෙම භාණ්ඩය මත රජය රු.10ක බද්දක් පැන වූයේ නම්, නිෂ්පාදකයා දරණ බද්ද කොපමණද?

(1) රු.2/- (2) රු.3/- (3) රු.4/- (4) රු.5/- (5) රු.6/-

**ආර්ථික විද්‍යාව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය**

**සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය**

**03. වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය**

**බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු**

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | |
|---|---|
| 1. | (5) |
| 2. | (3) |
| 3. | (1) |
| 4. | (3) |
| 5. | (1) |
| 6. | (2) |
| 7. | (5) |
| 8. | (5) |
| 9. | (1) |
| 10. | (1) |
| 11. | (2) |
| 12. | (3) |
| 13. | (1) |
| 14. | (1) |
| 15. | (5) |
| 16. | (4) |
| 17. | (1) |
| 18. | (2) |
| 19. | (2) |
| 20. | (5) |

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 03.වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. (i) Qd = 300 - 4P
   Qs = -60 + 8P

එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඉහත දැක්වේ.

(a) වෙළෙඳපොල සමතුලිත ඉල්ලුම් ප්‍රමාණය හා සමතුලිත මිල ගණනය කරන්න.
(b) සමතුලිතයේදී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.

(ii) මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු.6 ඒකක බද්දක් පැනවූයේ නම්

(a) බද්දට පසු සැපයුම් සමීකරණය ලියන්න.
(b) බද්දට පසු ගැනුම්කරුවා ගෙවන මිල කීයද?
(c) ඒකකයට ගැනුම්කරු දරන බදු බර කොපමණද?
(d) නිෂ්පාදකයා ලබන මිල කොපමණද?

(iii) අහිමිවන ආර්ථික සුබසාධනය ගණනය කරන්න.

2. Qd = 300 – 4P
   Qs = -60 + 8P

(i) වෙළෙඳපොල සමතුලිතයේදී සැපයුම් මිල නම්‍යතා ගණනය කරන්න.
(ii) සමතුලිතයේදී ආර්ථික අතිරික්තය කීයද?
(iii) රජය විසින් රු.6 ඒකක බද්දක් පැනවීමෙන් පසු ඒකක බද්ද නිසා පාරිභෝගිකයා හා නිෂ්පාදකයා දරන බදු ප්‍රමාණය කොපමණද?
(iv) බද්ද නිසා රජයට ලැබෙන බදු ආදායම සොයන්න.
(v) බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය කීයද?

3. Qd = 300 – 4P
   Qs = -60 + 8P

(i) භාණ්ඩයට රජය විසින් රු.25 උපරිම මිලක් නියම කලේ නම් වෙළෙඳපොල තුල ඇතිවිය හැකි ප්‍රතිවිපාක කවරේද?
(ii) එම උපරිම මිලේදී වෙළෙඳපොල තුල ඇතිවිය හැකි කළු කඩ මිල කීයද?
(iii) උපරිම මිල ප්‍රතිපත්තිය නිසා භාණ්ඩ සලාකනය සඳහා බිහිවිය හැකි මිල නොවන මාධ්‍යයන් මොනවාද?
(iv) උපරිම මිල හේතු කොටගෙන බිහිවන අධි ඉල්ලුම් ප්‍රමාණය ගණනය කරන්න.
(v) උපරිම මිලට පසු සැපයුම් ප්‍රමාණය කොපමණ ප්‍රමාණයකින් අඩුවේද?

4. $Q_d = 300 - 4P$

$Q_s = -60 + 8P$

(i) ඉහත භාණ්ඩයට රජය විසින් රු.6 ක ඒකක සහනාධාරයක් ලබා දීමට තීරණය කලේ නම් සහනාධාරයට පසු වෙළෙඳපොල සමතුලිතය සොයන්න.

(ii) සහනාධාරයට පසු නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්තය කීයද?

(iii) සහනාධාරයෙන් පසු ගැනුම්කරුවා ගෙවන මිල හා සැපයුම්කරු ලබන මිල කීයද?

(iv) රජයේ සහනාධාර පිරිවැය කීයද?

(v) සහනාධාර නිසා අහිමි වන සුබ සාධනය ගණනය කරන්න.

5. $Q_d = 300 - 4P$

$Q_s = -60 + 8P$

රජය විසින් ඉහත භාණ්ඩයට රු40ක මිල ආධාරකයක් ලබා දී ඇති අතර අතිරික්තය සැපයුම් ආධාරක මිල යටතේ රජය විසින් මිලදී ගනී.

(i) මෙම මිල ආධාරක ප්‍රතිත්තිය යටතේ රජයට දැරීමට සිදු වන පිරිවැය කොපමණද?

(ii) මිල ආධාරක ප්‍රතිපත්තියට පසුව පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය කොතරම් ප්‍රමාණයක්වේද?

(iii) අවම මිල සීමා නියම කිරීමෙහි ප්‍රතිවිපාක මොනවාද?

(iv) අවම මිල ප්‍රතිපත්තිය අර්ථවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 03.වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය
### ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) Qd = 300 – 4P
Qs = - 60 + 8P
Qd = Qs
300 – 4 P = - 60 +8P

$\frac{360}{12} = \frac{12P}{12}$

30 P

Qd = 300 – 4 (30)
Qd = 300 - 120
Qd = 180

(a) සමතුලිත මිල රු.30
සමතුලිත ප්‍රමාණය ඒකක 180

$\frac{\Delta Qd}{\Delta p} \times \frac{p}{Q}$

(b) -4 $\times \frac{30}{180} = \frac{-4}{6} =$ -0.66

(ii)

(a) $Qs = -60 + 8 (P - t)$
$Qs_1 = -60 + 8 (P - 6)$
$Qs_1 = -60 + 8P - 48$
$Qs_1 = -108 + 8P$

(b) $Qd = Qs_1$

300 – 4P = - 108 + 8P

$\frac{408}{12} = \frac{12P}{12}$

34= P

ගෙවුම්කරු ගෙවන මිල = රු.34

(c) ඒකකයකට ගැනුම්කරු ගෙවන ඒකක බද්ද

රු.34 - රු. 30 = රු.4.00

(d) $Qd_1 = 300 - 4P$

$Qd_1 = 300 - 4(P+t)$

$Qd_1 = 300 - 4(P+6)$

$Qd_1 = 300 – 4P - 24$

$Qd_1 = 276 – 4P$

$Qd_1 = Qs$

$276 – 4P = - 60 + 8P$

$276 + 60 = 12P$

$\frac{336}{12} = \frac{12\,P}{12}$

රු.28 = P විකුණුම්කරුට ලැබෙන මිල

(iii)අහිමි වන සුභ සාධනය

බද්දට පසු සමතුලිත ප්‍රමාණය 164 (ඒකක)
බද්දට පෙර සමතුලිත ප්‍රමාණය 180 (ඒකක)

$\frac{\text{සමතුලිත ප්‍රමාණ වෙනස} \times \text{ඒකක බද්ද}}{2}$

$\frac{16 \times 3}{2}$ = <u>රු.48 (අධි බදු බර)</u>

2. (i) $Qs = - 60 + 8P$

$\frac{\Delta Qs}{\Delta p} \times \frac{P}{Q} = 8 \times \frac{30}{180} = \frac{8}{6} = \underline{1.33}$

(ii) පාරිභෝගික අතිරික්තය $= \frac{(\text{උපරිම ඉ.මිල} - \text{සමතුලිත මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$= \frac{(70-30)\times 180}{2}$

$= \frac{20 \times 180}{2}$

<u>=රු. 3600</u>

නිෂ්පාදන අතිරික්තය $= \frac{(\text{සමතුලිත මිල} - \text{අවම සැපයුම් මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$= \frac{(30-7.50)\times 180}{2}$

$= \frac{22.50 \times 180}{2}$

<u>=රු. 2025</u>

ආර්ථික අතිරික්තය = රු. 3600 + රු. 2025

<u>= රු. 5625</u>

ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

(iii)

QS= -60+8p

QS= -60+8 (p –t)

QS= -60+8 ( p – 6)

QS= -60+8p – 48

QS= 108+8p

Qd = Qs

300 – 4p = 108 + 8p

$\frac{408}{12} = \frac{12p}{12}$

34= p

Qd = 300 – 4(34)

Qd = 300 – 136

Qd = 164

පාරිභෝගිකයා / ගැනුම්කරු දරණ බදු ප්‍රමාණය රු. 4 X 164 = රු. 656.00

නිෂ්පාදකයා දරණ බදු ප්‍රමාණය රු. 2 X 164 = රු. 328.00

(iv) රජයේ බදු ආදායම රු. 6 X 164 = රු.984.00

(v) බද්දට පසු පාරිභෝගික අතිරික්තය

$$\frac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{නව සමතුලිත මිල}) \times \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$\frac{(75 - 34) \times 164}{2}$$

$$\frac{41 \times 16y}{2} = \frac{6724}{2} = \text{රු. } 3362.00$$

නිෂ්පාදන අතිරික්තය

$$\frac{(\text{නිෂ්පාදකයාට ලැබෙන මිල} - \text{අවම සැපයුම් මිල}) X \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$\frac{(28-7.5) \times 16\, y}{2} = \text{රු.}1681.00$$

3. Qd = 300 – 4p

Qd = -60 + 8p

(i) 1. අධි ඉල්ලුම් තත්වයක් ඇති වීම.
2. නීති විරෝධී කළුකඩ මිලකට භාණ්ඩ අලෙවි කිරීම.
3. වෙළෙඳපොලේ භාණ්ඩ හිඟයක් ඇති වීම.
4. නිෂ්පාදකයින්ගේ ලාභ සීමා වන නිසා නිෂ්පාදන ක්ෂේත්‍රය තුල ආයෝජන සීමා වීම.
5. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට ඇති වන අයහපත් බලපෑම නිසා සමාජ සුබසාධනයට හානි වීම.

(ii)
උපරිම මිලේ දී සපයනු ලබන සැපයුම් ප්‍රමාණය

a) Qd = 300 – 4p b)Qs = -60 + 8 (25)

Qd = 300 – 4 (25) Qs = -60 + 200

Qd = 300 – 100 Qs = 140

Qd = 200

අධි ඉල්ලුම = 200 – 140

= 60 ඒකක 140ක් ඉල්ලුම් කරනු ලබන මිල

140 = 300 – 4 p

140 – 300 = - 4p

$\frac{-160}{-4}$ = P

= <u>රු.40.00 කළු කඩ මිල</u>

(iii)1.සලාක පත් යොදා ගැනීම.
2.පෝලිම් ක්‍රමය
3.අල්ලස් මඟින් සලාක කිරීම.
4.වෙනත් භාණ්ඩ සමඟ සම්බන්ධ කොට සලාක කිරීම.
5.කළු කඩ මිල

(iv)

Qd = 300 – 4 (25)

Qd = 300 – 100

Qd = 200

Qs = -60 + 8 (25)

Qs = -60 + 200

Qs = 140

අධි ඉල්ලුම = ඉල්ලුම් ප්‍රමාණය - සැපයුම් ප්‍රමාණය

= 200 – 140

අධි ඉල්ලුම = 60 ඒකක

(v) උපරිම මිලට පෙර සමතුලිත ප්‍රමාණය

Qd = Qs

300 – 4P = -60 +8p

සමතුලිත මිල රු.30 සමතුලිත ප්‍රමාණය ඒකක 180

උපරිම මිලේදී සැපයුම් ප්‍රමාණය

Qs = -60 + 8 (25)

Qs = -60 + 200

Qs = 140

180 – 140 = සැපයුම් ප්‍රමාණය ඒකක 40කින් අඩුවේ.

4)

(i)

$Qs_1 = -60 + 8\ (P+S)$

$Qs_1 = -60+8\ (P+S)$

$Qs_1 = -60+8P+48$

$Qs_1 = -12+8P$

$Qd = Qs_1$

$300 - 4p = -12+8p$

$\frac{312}{12} = \frac{12p}{12}$

$Qd = 300 - 4(26)$

$Qd = 300 - 104$

$Qd = 196$

සමතුලිත මිල රු. 26

සමතුලිත ප්‍රමාණය ඒකක 196

(ii)

සහනාධාරයට පසු

පාරිභෝගික අතිරික්තය = $\frac{(\text{උ.ඉ.මිල - නව සමතුලිත මිල})\ x\ \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$

$= \frac{(75 - 26)\ x\ 196}{2}$

$= \frac{49\ x\ 196}{2} =$ රු.4802

නිෂ්පාදන අතිරික්තය = $\frac{(\text{සැපයුම්කරුට ලැබෙන මිල - අවම සැ.මිල})\ x\ \text{නව සමතුලිත ප්‍රමාණය}}{2}$

සැපයුම්කරුට ලැබෙන මිල =රු.26 + 6

=රු.32

$= \frac{(32 - 7.50)\ x196}{2} =$

$= \frac{24.50\ x\ 196}{2} = \frac{4802}{2} =$ රු.2401

(iii)සහනාධාරයට පසු

ගැනුම්කරු ගෙවන මිල රු.26

සැපයුම්කරු ලබන මිල රු.26 + රු.6 = රු.32

(iv)රජයේ පිරිවැය = රු.6 x 196 = රු.1176

(v)

අභිමිවන සුභසාධනය = $\frac{\text{සමතුලිත ප්‍රමාණයේ වෙනස x සහනාධාරය}}{2}$

$= \frac{16\ x6}{2} =$ රු.48

5)

(i) ආධාරක මිල යටතේ ඉල්ලුම් ප්‍රමාණය

Qd = 300 – 4(40)

Qd = 300 – 160

Qd = 140

සැපයුම් ප්‍රමාණය

Qs = -60 + 8(40)

Qs = -60+320

Qs = 260

අධි සැපයුම් ප්‍රමාණය = 260 – 140

= 120 ඒකක

රජයට දැරීමට සිදුවන පිරිවැය = 120 x 40

= රු.4800

(ii) මිල ආධාරක ප්‍රතිපත්තිය යටතේ

පාරිභෝගික අතිරික්තය

$\frac{\text{(උ.ඉ.මිල - ආධාරක මිල)}}{2}$ x ආධාරක මිල යටතේ ඉ. ප්‍රමාණය

$\frac{(75-40) \times 140}{2} = \frac{4900}{2} =$ රු.2450

නිෂ්පාදක අතිරික්තය

$\frac{\text{(ආධාරක මිල - අ.සැ.මිල)}}{2}$ x ආධාරක මිල යටතේ ඉ. ප්‍ර මාණය

$\frac{(40-7.50) \times 260}{2} = \frac{8450}{2} =$ රු.4225

(iii)

1. තොග සමුච්චනය වීම.
2. සේවා සම්බන්ධයෙන් ගත් කළ විරැකියාව වැනි ගැටළු ඇති වීම.
3. අධි ආයෝජන තත්ත්වයක් ඇති වීම.
4. සමාජ සුභසාධනයට බලපෑම් ඇති වීම.
5. අධි සැපයුම් තත්ත්වයක් ඇති වීම.

(iv)

1. අතිරික්ත ගබඩා කිරීම
2. අතුරු නිෂ්පාදනය
3. පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය
4. අපනයනය

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."